# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2235/9 – 2021 ජූලි 05 වැනි සඳුදා – 2021.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2018/173.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.07.08 දිනැති හා අංක 2183/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.12.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කෝට්ටේ, ඇතුල්කෝට්ටේ, මහින්දාරාම පාර, අංක 77/8/ඒ හි පදිංචි ඩී. එස්. පී. රොෂාන් තරින්ද්‍ර මයා සහ බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 1060 හි පිහිටි හෝම් ලැන්ඩ්ස් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.02.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 අප්‍රේල් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කාර්මික අධිකරණයේ දී ය.**

ඩී. එස්. පී. රොෂාන් තරින්ද්‍ර මහතා,
අංක 77/8/ඒ,
මහින්දාරාම පාර,
ඇතුල්කෝට්ටේ,
කෝට්ටේ.

ඒ/31/2020
IR/COM/03/2018/173

පළමු පාර්ශව සහ

හෝම් ලෑන්ඩ්ස් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 1060,
පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

දෙවන පාර්ශවය.

**ඉහත දෙපාර්ශවය අතර පවත්නා අංක ඒ/31/2020 දරන කාර්මික ආරාවුලට අදාළ ප්‍රදානය**

නිපුණතා සංවර්ධන රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත කී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් හෝකන්දර උතුර, අරංගල, රණමයුරු මාවතේ, අංක 453/එෆ් හි පදිංචි විතාරණගේ ජයරත්න වන මා වෙත යොමු කර ඇත.

එකී යොමු කිරීමට අනුව ඉහත කී කාර්මික ආරාවුලට හේතු පාදකවී ඇති කරුණු වනුයේ හෝම් ලෑන්ඩ්ස් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සේවා යෝජක විසින් ඩී. එස්. පී. රොෂාන් තරින්ද්‍ර මහතාගේ සේවය 2016.08.13 සිට 2016.11.07 දින දක්වා වැටුප් රහිතව අත්හිටුවා තැබීමෙන් ඒ මහත්මයාට අසාධාරණයක් සිදුවී තිබේ ද? අසාධාරණයක් සිදු වී ඇත්නම් කුමන සහනයක් හිමි විය යුතු ද යන මූලික කරුණු විසඳිය යුතු බව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් දන්වනු ලැබ ඇත.

2021.01.20 දින නඩුව කැඳවූ අවස්ථාවේ දී පළමු පාර්ශවය වන රොෂාන් තරින්ද්‍ර යනුවෙන් නම සඳහන් අය පැමිණ සිටි අතර, ඔහු විසින් ඔහුගේ නම නිවැරදිව රොෂාන් ද සිල්වා විය යුතු බව සඳහන් කරන ලදී. නීතිඥ නියෝජනයක් ඔහු වෙනුවෙන් සිදු නොවුණි. දෙවන පාර්ශවය වෙනුවෙන් ආයතනයේ නීතිඥ දිවා රුවන්පුර මහතා පෙනී සිටි අතර, ආයතනය වෙනුවෙන් කළමනාකරු (මානව සම්පත්) රංග ජයසිංහ මහතා පෙනී සිටින ලදුව සමථයක් සම්බන්ධයෙන් විමසා සිටි අවස්ථාවේ දී පළමු පාර්ශවය ප්‍රකාශ කර සිටියේ මසක් සහ දින 11 ක වැටුප සමග ඔහුගේ අ.පො.ස. සාමාන්‍ය පෙළ මුල් සහතිකයත් පාසැල් හැර යාමේ සහතිකයේ මුල් පිටපතත් ලබා දෙන්නේ නම් සමාදානයක් වශයෙන් අවසන් කළ හැකි බව යි.

එහෙත් මුදල් ගෙවීමට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වන හෙයින් 2021.02.29 දින නැවත කැඳවන ලෙස දෙවන පාර්ශවය විසින් ඉල්ලා සිටින ලදී. කෙසේ වෙතත් එදින වන විට දෙවන පාර්ශවය වන ආයතනයේ Covid 19 රෝගියෙකු හමුවීම හේතුවෙන් වසා තබන්නට සිදු වූ බවත් අවශ්‍ය පියවර ගැනීමට හැකියාවක් නොතිබූ බවත්, 2021.02.09 දින වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන්නට යෙදුණි.

ඒ අනුව දෙපාර්ශවයේ එකඟතාව මත 2021.02.24 දින නැවත කැඳවන ලද අතර, එදින පූර්ණ හා අවසාන සමථයක් වශයෙන් අංක 718720 සහ 2021.02.23 දිනැති රුපියල් 58083.33/- ක් වටිනාකම සඳහන් සම්පත් බැංකු චෙක්පත විවෘත අධිකරණයේ දී පළමු පාර්ශවයට ලබාදෙන ලද අතර, අ.පො.ස. සා.පෙළ සහතිකය සහ පාසල් හැරයාමේ සහතිකය කාර්යාලයේ දී ලබාදීමටත් පළමු පාර්ශවය එසේ ලබා ගැනීමටත් එකඟව පූර්ණ සහ අවසන් සමථයක් වශයෙන් මෙම නඩුව අවසාන කරන්නට යෙදුණි.

වගඋත්තරකාර පාර්ශවය වැඩිදුරටත් එකඟ වූයේ මුල් සහතික තිබේනම් සොයා බලා ලබාදීමටත් යම් හෙයකින් අස්ථානගතවීමක් හෝ සොයාගත නොහැකි තත්ත්වයක් ඇති වුවහොත් සහතික පිටපත් ලබාගැනීම සඳහා අවශ්‍ය ගෙවීම් ලබාදීමටත් හැකි බවයි. එසේ ලබාගන්නට පළමු පාර්ශවය විසින් එකඟත්වය ප්‍රකාශ කර සිටි හෙයින් මෙම නඩුව පූර්ණ සහ අවසාන සමථයක් වශයෙන් අවසන් කරන ලදී. මෙම කරුණු මතම නැවත නඩු පැවරීමට නොහැකි බවටත් දෙපක්ෂයම එකඟව මෙම නඩුව අවසන් කරන්නට යෙදුණි.

මෙම කාර්මික ආරාවුල පූර්ණ සහ අවසාන සමථයක් වශයෙන් දෙපාර්ශවයේ පූර්ණ එකඟත්වය මත අවසන් කරන්නට යෙදුණු බවත්, මෙම සමථය සාධාරණ සහ යුක්ති සහගත සමථයක් බවත් වැඩි දුරටත් සහතික කරමි.

විතාරණගේ ජයරත්න,
බේරුම්කරු.

2021 පෙබරවාරි මස 24 වැනි දින දීය.

07 - 300

මගේ අංකය: IR/COM/04/2019/139.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.12.30 දිනැති හා අංක 2208/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 02, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, අංක 457 හි පිහිටි ලංකා වතු හා කර්මාන්ත සේවක සංගමය සහ කොළඹ 02, පාක් වීදිය, අංක 33, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, 12 වන මහලෙහි පිහිටි ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, කිරිල්ලවල, නුවර පාර, අංක 333ජී හි පිහිටි වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.03.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 මැයි මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කාර්මික අධිකරණයේ දී ය.**

ලංකා වතු හා කර්මාන්ත සේවක සංගමය
ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත,
කොළඹ 02.

නඩු අංකය A/72/2020

සහ

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
12 වන මහළ,
පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල,
අංක 33, පාක් වීදිය,
කොළඹ 02.

02. වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පුද්ගලික සමාගම,
අංක 333ජී, නුවර පාර,
කිරිල්ලවල.

**ඉහත පාර්ශවයන් අතර පවත්නා අංක A/72/2020 දරන කාර්මික ආරාවුලට අදාළ ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමන් විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් එතුමාට පැවරී ඇති බලතල හා එකී ආරාවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බණ්ඩාරවෙල, හීල්ඔය පාර, කොලතැන්න ''රික්ටන්'' හි පදිංචි බී. රවින්ද්‍රලාල් ගුණවර්ධන වන මා වෙත 2020 දෙසැම්බර් මස 10 වන දින බාර දී ඇත. එසේ යොමු කිරීමට හේතුව වී ඇති කාර්මික ආරාවුල වනුයේ ''දැනට වැඩවර්ජනයට හේතු වී පවතින ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අයත් වැකඩ සහ බුත්තල ගොවිපලවල්හි වීරසිංහ මැන් පවර්ස් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සේවයේ යොදවා ඇති සේවකයින්ගේ දෛනික වැටුප රු. 300කින් වැඩිකරන ලෙස ඉල්ලා ලංකා වතු හා කර්මාන්ත සංගමය විසින් සිදු කරන ඉල්ලීම සාධාරණ හා යුක්තිසහගත ද? යන්න හා එසේ නම් සාධාරණ හා යුක්ති සහගත වන්නේ නම් ඔවුනට කුමන සහන සැලසිය යුතුද? යන්නය.

නඩු අංකය A/72/2020

01. මෙම නඩුව එවකට කම්කරු වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමන් විසින් බත්තරමුල්ල, පන්නිපිටිය පාර, නො. 77 පදිංචි ටී. පියසෝම මහතාට බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මෙම ආරවුල විසඳීමට බේරුම්කරු වශයෙන් පත් කර ඇත. එහි දිනය 2019.06.06 වශයෙනි.

02. ඉන් අනතුරුව එවකට එම අමාත්‍යාංශයේ ලේකම්වරයා වූ ආර්. පී. ආර්. රාජපක්ෂ මහතා ටී. පියසෝම මහතා වෙත නැවතත් අදාළ ආරාවුල විසඳීමට අවශ්‍ය සහයන් ලබාගැනීම පිණිස 2582586 දුරකථන අංකය ලබාදී මෙම ආරාවුල විසඳීමට දැනුවත් කොට ඇත.

03. ඉන් අනතුරුව වරින්වර 2019.08.09 සිට 2020.03.12 දක්වා එකළොස් වාරයක් එකී බේරුම්කරු වන ටී. පියසෝම මහතා විසින් මෙම නඩුව වරින්වර කැඳවා ඇති බව නිරීක්ෂණය වේ. නමුත් ඒ සෑම අවස්ථාවකදීම ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ වීරසිංහ මෑන් පවර්ස් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතන සඳහා පැමිණි නියෝජිතයින් එම ලංකා වතු කර්මාන්ත සංගමය විසින් ඉල්ලා ඇති සියලුම දේ ප්‍රතික්ෂේප කර ඇත.

04. 2019 ක් වූ ජූලි මස 11 දින කාර්මික අධිකරණයට ලිපියක් ඉදිරිපත් කරමින් ලංකා වතු හා කාර්මික සේවක සංගමයේ ලේකම් චාමර නානායක්කාර මහතා විසින් ඔවුන්ගේ සංගමයට අනුබද්ධ කොළඹ 02, ආචාර්ය නෙල්සන් ආර්. ද සිල්වා මාවතේ පිහිටි ලංකා කම්කරු සම්මේලනයේ නියෝජ්‍ය ලේකම් ජයන්තා පන්නිලගේට බලය පවරා ගරු අධිකරණය වෙත ලිපියක් ඉදිරිපත් කොට ඇත.

05. ඉන් පසු වරින්වර ලංකා වතු සේවක සංගමය වෙනුවෙන් චාමර නානායක්කාර මහතා සහ එම සංගමයේ සභාපති මෙන්ම එම පාර්ශවයන් වෙනුවෙන්ම නියෝජිත ජයන්තා වන්නිලගේ මහතා ද එකම දිනයන්හි පෙනී සිට ඇත. යම් කිසි පුද්ගලයෙකුට හෝ ආයතනයකට බලය පවරන්නේ නම් ඉන් පසු නඩු වාරයන් වලදී පැවරූ අයත් පැවරුම් ලාභියත් පැමිණීම අනවශ්‍ය බවත් නිරීක්ෂණය වේ. එමෙන්ම ලංකා කම්කරු සම්මේලනයට බලය පවරන්නේ කිනම් හේතුවක් නිසා දැයි නිරීක්ෂණය නොවේ.

06. කෙසේ වෙතත් බේරුම්කරණයට යොමු වන අවස්ථාවේදී කම්කරුවන් වැඩවර්ජනය අවසන් කොට සේවය සඳහා වාර්තා කොට ඇති බව නිරීක්ෂණය වේ. ඒ බව මා බේරුම්කරු වශයෙන් විමසනු පළමු දිනයේදීම නිරීක්ෂණය විය.

07. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සේවකයින් සපයන වීරසිංහ මෑන් පවර්ස් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා ගිවිසුම ද මා නිරීක්ෂණය කළෙමි.

08. එක් එක් සේවකයෙකු සඳහා පඩි සහ සියලුම දීමනා ගෙවනු ලබන්නේ ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වුවද ඔවුන් එය ගෙවනු ලබන්නේ වීරසිංහ මෑන් පවර්ස් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හරහාය. ඩෝල් ලංකා ආයතනය කිසිම දිනක සේවකයන් සඳහා ගෙවීමක් නොකර ඇති බව නිරීක්ෂණය වේ. එබැවින් මා නඩුව විමසූ දෙවැනි දිනයේ දී ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නැවත දන්වන තුරු පැමිණීම අනවශ්‍ය බව 2021.02.09 දින ප්‍රකාශ කළෙමි.

09. එමෙන්ම සේවකයින් සේවයට පත් කිරීම සඳහා පත්වීම් ලිපි ලබා දීම කර ඇත්තේ වීරසිංහ මෑන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බැවින් සේවකයින් පඩි හෝ දීමනා ලබා දීම සඳහා සම්පූර්ණ වගකීම නෛතිකව ඇත්තේ වීරසිංහ මෑන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතය.

10. එකී සේවකයන්ගේ පත්වීම් ලිපි අහඹු වශයෙන් මා අධිකරණය වෙත ගෙන්වා ගත් අතර එම සේවකයින් එවකට තම දෛනික පඩිය වශයෙන් රු. 840/- (රු. අටසිය හතලිහක්) සඳහා කැමැත්ත පළකොට නෛතික ගිවිසුමකට එළඹ ඇති බව නිරීක්ෂණය වේ. එම ගිවිසුම්වල පිටපත්වල පිටපත් x2 වශයෙන් 71 සහ 72 යනුවෙන් දක්වා A/72/2020 නඩු ගොනුවේ ඇතුළත පිටුවල අමුණා ඇත.

11. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි ව්‍යාපාරික කටයුත්ත වනුයේ එම ලබා දී ඇති ඉඩම්වල කෙසෙල් වගාකොට එම පළතුරු ආනයනය කිරීමයි. ඒ සඳහා ඔවුන් අවශ්‍ය නීතිමය කටයුතු සපුරා ඇත.

12. සේවකයින් සපයා ගැනීම සඳහා වගඋත්තර පාර්ශවයන්ගේ දෙවැනි පාර්ශවය වන නො. 333, නුවර පාරේ, කිරිල්ලවල ලිපිනයේ පිහිටි වීරසිංහ මෑන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත ගිවිසුමකින් පවරා ඇත.

13. ඒ අනුව දෛනික වැටුප් සහ වැඩිවීමේ ප්‍රතිශතයන් දක්වා ගොනුවේ 13 පිටුවේ විස්තරයන් දක්වා ඇත. ඒ අනුව රු. 660/- සිට වරින්වර පඩි වැඩිකොට 2020 වර්ෂයේ දී එම මුදල රු. 1040/- (රු. එක්දහස් හතලිහක්) වශයෙන් දක්වේ.

14. එකී ගිවිසුම මත පදනම්ව ඒවායේ සේවයේ නියුක්ත ශ්‍රමිකයින් වෙනුවෙන් වැටුප් ගෙවීම වාර්ෂික වැටුප් වර්ධන සහ වාර්ෂික ප්‍රසාද දීමනා තීරණය වන අතර එම ගිවිසුම අනුව මේ දක්වා සියලු ගෙවීම් ලබාදීමට සේවකයින් විසින් එක් එක් වශයෙන් පුද්ගලිකව තම අත්සන් යොදා පත්වීම් ලිපි ලබාගෙන වීරසිංහ මෑන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ සේවා ගිවිසුම්වලට එළඹ ඇත. එය මෙම නඩුවේ ප්‍රධාන ලියවිල්ලක් බව මා හට නිරීක්ෂණය විය.

15. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ කම්කරු හෝ වේවා ඒ ඒ පාර්ශවයන් (ශ්‍රමිකයින්) සඳහා පඩි ගෙවන ආකාරය රජය පිළිගත් ලියවිල්ල වන පඩි පාලන සභාවේ අවසන් වෙලුම මා පරිශීලනය කළ අතර එහි නියාමනයන්ට ද අනුකූලව පඩි හා දීමනා ගෙවා ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත කී කරුණු කාරණා හේතුවෙන් ලංකා වතු සහ කර්මාන්ත සේවක සංගමය විසින් ඉල්ලා ඇති රු. 300/- පඩි වැඩි කිරීම යුක්තිසහගත නොවන අසාධාරණ ඉල්ලීමක් බව ප්‍රකාශකොට අත්සන් තබමි.

**බී. රවීන්ද්‍රලාල් ගුණවර්ධන,**
බේරුම්කරු.

2021 මාර්තු මස 28 වැනි දින දී ය.
ගරු කාර්මික අධිකරණයේ දී ය.

07 - 301

---

මගේ අංකය: IR/COM/01/2019/321.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.02.05 දිනැති හා අංක 2213/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.01.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 03, ඇලෝයි මාවත, අංක 06 හි ලංකා වතු සේවා සංගමය සහ මහරගම, නාවින්න, හයිලෙවල් පාර, අංක 310 හි ආර්.පී.සී. ප්ලාන්ටේෂන්ස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම, මහරගම, නාවින්න, හයිලෙවල් පාර, අංක 310 හි පිහිටි කෑගලු ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී., මහරගම, නාවින්න, හයිලෙවල් පාර, අංක 310 හි පිහිටි නමුණුකුල ප්ලාන්ටේෂන්ස්, මහරගම, නාවින්න, හයිලෙවල් පාර, අංක 310 හි පිහිටි මස්කෙලිය ප්ලාන්ටේෂන්ස් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.04.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 මැයි මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ කාර්මික බේරුම්කරණ විනිශ්චය සභාවේ දී ය.**
**බේරුම්කරු - එල්. ඒ. ප්‍රියන්ති ලියනආරච්චි මැතිනිය ඉදිරිපිට දී ය.**

ලංකා වතු සේවා සංගමය,
අංක 6,
ඇලෝයි මාවත,
කොළඹ 03.

පළමු පාර්ශවය

සහ

01. ආර්.පී.සී. ප්ලාන්ටේෂන්ස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම,
02. කෑගලු ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී.,
03. නමුණුකුල ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී.,
04. මස්කෙලිය ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී.,
අංක 310, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම.

දෙවන පාර්ශවය

අතර පවත්නා කාර්මික ආරාවුල

ආරාවුල් අංකය - IR/COM/01/2019/321
බේරුම්කරණ අංකය - A/13/2021
2021 අප්‍රේල් මස 01 වැනි දින දී ය.

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.09.30 වන දින අංක 2195/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.09.23 වැනි දින දරන නියෝගයෙන්, ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

''ලංකා වතු සේවා සංගමය සහ ලංකා සේව්‍ය සම්මේලනය අත්සන් තබා ඇති ගිවිසුම අනුව 2019 ඔක්තෝබර් මස සිට 25% ක වැටුප් වැඩි කිරීමක් වතු සමාගම් 22 ක් තුළ ක්‍රියාත්මක විය යුතුව ඇති නමුත් ආර්.පී.සී. ප්ලාන්ටේෂන්ස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම මගින් පාලනය වන කැගලු ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී., නමුණුකුල ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී. සහ මස්කෙලිය ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී. යන වතු සමාගම් තුන එය දීමනාවක් ලෙස ලබාදීමෙන් සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා ඉන් අසාධාරණයක් සිදුව තිබේනම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

බේරුම්කරණය සඳහා මා වෙත ඉදිරිපත් කර තිබූ උක්ත කාර්මික ආරාවුලේ පළමු පාර්ශවය (ලංකා වතු සේවා සංගමය) සිය පැමිණිල්ල ඉල්ලා අස්කරගෙන ඇති බැවින් උක්ත පාර්ශව අතර තවදුරටත් කාර්මික ආරාවුලක් නොමැති නිසා බේරුම්කරන ප්‍රදානයක් ලාබදීමට අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරමි.

එල්. ඒ. ප්‍රියන්ති ලියනආරච්චි මහත්මිය,
බේරුම්කරු.

2021 අප්‍රේල් මස 01 වැනි දින දීය.

07 - 302

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.